# 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පණත යටතේ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් තොරතුරු ඉල්ලා සිටීමේ මූලික ක්‍රියාපටිපාටිය

තොරතුරු සඳහා ඉල්ලුම් කිරීම ඒ වෙනුවෙන් සකස් කර ඇති RTI 01 ආකෘති පත්‍රයේ ආකාරයට (මෙය නියෝගයක් නොවුනත්) සම්පූර්ණ කර පහත සඳහන් තොරතුරු නිලධාරියා වෙත ඉදිරපත් කළයුතුය.

**පොදු තොරතුරු නිලධාරියාගේ විස්තර**


නම : සුමුදු පාගොඩ මහත්මිය
තනතුර : මෙහෙයුම් අධ්‍යක්ෂක
ලිපිනය : ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය
29/24 විශාඛා පෞද්ගලික පාර, කොළඹ 4, ශ්‍රී ලංකාව.
කාර්යාලය : +94(0) 112506391 දිගුව - 113
ෆැක්ස් : +94(0) 112507087 දිගුව - 118
විද්‍යුත් ලිපිනය : directoroperations@cma-srilanka.org
වෙබ් : www.cma-srilanka.org


1. තොරතුරු ඉල්ලුම් කිරීම වාචිකව හෝ ලිඛිත ආකෘති පත්‍රය මගින් කළද ලැබුනු බවට ලිඛිත දැන්වීමක් තොරතුරු නිලධාරියාගෙන් ලබා ගන්න.
2. හැකි ඉක්මනින්, කෙසේ වෙතත් දින 14 ක් ඇතුලත තොරතුරු ලබා දෙනවාද නැද්ද යන තීරණය දෙනු ලැබේ.
3. තොරතුරු ලබා දීමට තීරණය කළේ නම්, තොරතුරු නිලධාරියා තොරතුරු දැන ගැනීමේ කොමිසම විසින් නියම කර ඇති ගාස්තු ලේඛනයට අනුව තොරතුරු සැපයීම සඳහා ගාස්තුවක් ගෙවන ලෙසට ඉල්ලමින් පුරවැසියා දැනුවත් කරයි. තොරතුරු ගෙවීමකට යටත් වන්නේ නම් ගෙවීම සිදු කොට දින 14 ක් ඇතුලත තොරතුරු සපයනු ලැබේ. ගෙවීමක් කිරීම අවශ්‍ය නොවන්නේ නම් තීරණය ගෙන දින 14 ක් ඇතුලත තොරතුරු සපයනු ලබයි.
4. ගාස්තු ගෙවීමෙන් දින 14 කට පසුව තොරතුරු සැපයීමට නොහැකි වූයේ නම් තවදුරටත් දිගු කාලයක් එනම් උපරිම දින 21 ක් ගතවන බව ඉල්ලුම් කළ තැනැත්තා වෙත දන්වන අතර කාලය දිගු කිරීම සඳහා වූ හේතුන්ද දන්වනු ලබයි.
5. ඉල්ලීම පුරවැසියෙකුගේ ජීවිතය සහ පෞද්ගලික නිදහස සමග බැඳුනු එකක් වනවිට තොරතුරු නිලධාරියා පැය 48 ක් ඇතුලත එම ඉල්ලීමට ප්‍රතිචාර දක්වනු ඇත.
6. පහත දක්වා ඇති අවස්ථාවලදී අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.
   (අ) තොරතුරු නිලධාරියා තොරතුරු සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ විට

   (ආ) පස්වන (5) වගන්තිය යටතේ නිදහස්වන තොරතුරුවලට ප්‍රවේශවීමට තොරතුරු නිලධාරියා ප්‍රතික්ෂේප කළ විට

   (ඇ) පණතේ විශේෂයෙන් සඳහන් කර ඇති කාල රාමුවට අනුකුල නොවන විට

   (ඈ) තොරතුරු නිලධාරියා අසම්පූර්ණ, නොමග යවන සුළු හෝ වැරදි තොරතුරු ලබා දුන් විට

(ඉ) තොරතුරු නිලධාරියා ගාස්තු වැඩියෙන් අය කළ විට

(ඊ) ඉල්ලුම් කළ ආකෘතියට අනුව තොරතුරු සැපයීම තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට

(උ) තොරතුරු ඉල්ලුම් කරන පුරවැසියා හට, තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඔහුව හෝ ඇයව වලක්වමින් තොරතුරු විකෘති කර ඇති බවට, විනාශ කොට ඇති බවට හෝ අස්ථාන ගත කර ඇති බවට විශ්වාස කළහැකි, සාධාරණ පසුබිමක් ඇති විට

**අභියාචනයක් දින 14 ක් ඇතුලත නම් කළ නිලධාරියා වෙත යොමු කළ යුතුය.**

නම් කළ නිලධාරියා : කණිෂ්ක ජයසිංහ මහතා

තනතුර : ප්‍රධාන විධායක නිලධාරි

ලිපිනය : ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය
29/24 විශාඛා පෞද්ගලික පාර, කොළඹ 4, ශ්‍රී ලංකාව.

කාර්යාලය : +94(0) 112506391 දිගුව - 112

ෆැක්ස් : +94(0) 112507087 දිගුව - 118

විද්‍යුත් ලිපිනය : directoroperations@cma-srilanka.org

වෙබ් : www.cma-srilanka.org

7. මෙම දැන්වීමේ අංක 6 යටතේ සඳහන් කොට ඇති පරිදි අභියාචනයක් ඉදිරිපත් කරන විට RTI 10 ආකෘතිය පුරවා නම් කළ නිලධාරි වෙත භාර දෙන්න. තොරතුරු ඉල්ලුම් කරන පුරවැසියෙකුට අභියාචනය සාධාරණීකරණය කරමින් RTI 10 ආකෘතියේ සඳහන් මූලික තොරතුරු සමග ලිපියක් ඉදිරිපත් කළ හැකිය.

**ගාස්තු ලේඛනය**

2017 - 02 - 03 දිනැති (අංක 2004/66) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළමුවන කොටසෙහි 01 වන වගන්තියෙන් දෙන ලද, 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පණත යටතේ ප්‍රකාශ කර ඇති රෙගුලාසි සහ පසුව ඇති වූ නීති මත පදනම්ව ගාස්තු ලේඛනය පහත සඳහන් පරිදි වේ.

**ඉල්ලුම් පත් ගාස්තු**

පුරවැසියෙකු තොරතුරු ඉල්ලුම් කිරීමේදී සහ තොරතුරු ඉල්ලීමක් සකස් කිරීමේදී තොරතුරු දැන ගැනීම සඳහා වූ අයදුම් පත සැපයීමට ගාස්තු අය නොකරයි.

**තොරතුරු සඳහා වූ ගාස්තු**

**1 ඡායා පිටපත් ගැනීම**

(අ) තොරතුරු A4 ප්‍රමාණයේ (21cm × 29.7 cm) කඩදාසියක සහ කුඩා ප්‍රමාණ කඩදාසියක සැපයීම සඳහා එක් කඩදාසියක තනි පැත්ත රු. 2/- ක් සහ දෙපැත්ත රු. 4/- ක් වේ.

(ආ) නෛතික ප්‍රමාණයේ (21.59cm × 35.56cm) සහ A 3 (29.7cm × 42cm) ප්‍රමාණය දක්වා කඩදාසියක තොරතුරු සැපයීම සඳහා එක් කඩදාසියක තනි පැත්ත රු. 4/- ක් සහ දෙපැත්ත රු. 8/- ක් වේ.

(ඇ) ඉහතින් සඳහන් කළ ප්‍රමාණවලට වැඩි ප්‍රමාණයේ කඩදාසියක තොරතුරු සපයන විට එය සත්‍ය වියදමට සිදුකරනු ලැබේ.

**2 මුද්‍රිත පිටපත්**

(අ) A4 ප්‍රමාණයේ (21cm × 29.7 cm) කඩදාසියක සහ කුඩා ප්‍රමාණ කඩදාසියක තොරතුරු සැපයීම සඳහා එක් කඩදාසියක තනි පැත්ත රු. 4/- ක් සහ දෙපැත්ත රු. 8/- ක් වේ.

(ආ) නෛතික ප්‍රමාණයේ (21.59cm × 35.56cm) සහ A 3 (29.7cm × 42cm) ප්‍රමාණය දක්වා කඩදාසියක තොරතුරු සැපයීම සඳහා එක් කඩදාසියක තනි පැත්ත රු. 4/- ක් සහ දෙපැත්ත රු. 8/- ක් වේ.

(ඇ) ඉහතින් සඳහන් කළ ප්‍රමාණවලට වැඩි ප්‍රමාණයේ කඩදාසියක තොරතුරු සපයන විට එය සත්‍ය වියදමට සිදුකරනු ලැබේ.

3 තොරතුරු ඉල්ලුම් කරන පුරවැසියෙකු විසින් සපයනු ලබන Diskettes (තැටි) Compact Disc (සංයුක්ත තැටි) USB mass driver (සමූහ ධාවක) හෝ සමාන ඉලෙක්ට්‍රොනික යෙදුම් මත තොරතුරු පිටපත් කිරීම සඳහා රු. 20/- ක් වේ.

4 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් සපයනු ලබන Diskettes (තැටි) Compact Disc (සංයුක්ත තැටි) USB mass driver (සමූහ ධාවක) හෝ සමාන ඉලෙක්ට්‍රොනික යෙදුම් මත තොරතුරු පිටපත් කිරීම සත්‍ය වියදමට කරනු ලැබේ.

5 යම්කිසි ලියවිල්ලක් හෝ ද්‍රව්‍යයක් අධ්‍යයනය කිරීමේදී හෝ පරීක්ෂා කිරීමේදී හෝ ඉදිකිරීම් වැඩ බිමක් පරීක්ෂා කිරීමේදී පැයකට වැඩි කාලයක් ගන්නේ නම් පළමුවන පැය අයකිරීමකින් තොරව යන්නට යටත්ව ඊට වැඩි පැයකට රු. 50/-ක් බැගින් අය කෙරේ. කලින් එවැනි තොරතුරු අය කිරීමකින්

තොරව සැපයීමේ පුරුද්දක් වූයේ නම් එම පරිචය තවදුරටත් අඛණ්ඩව පැවතීමට මෙය අගතියක් නොවියයුතුය.

6 නියැදි හෝ මාදිලි සඳහා සත්‍ය පිරිවැය අය කරනු ලබයි.

7 විද්‍යුත් තැපැල මගින් සපයනු ලබන තොරතුරු අය කිරීමකින් තොර වේ.

**අයකිරීමකින් තොරව සපයන තොරතුරු**

1 තොරතුරු සැකසුම් කරන හෝ අඩංගු කරන පිටු හතරක (A 4 ප්‍රමාණය) ඡායා පිටපත් ගැනීම හෝ මුද්‍රිත වියදම අය කිරීමෙන් තොර වේ.

2 සාමාන්‍යයෙන් අය කිරීමකින් තොරව ලබා ගත හැකි තොරතුරු අයකිරීමකින් තොරවම සපයනු ලැබේ.

**ගාස්තු ගෙවීමේ ක්‍රමය**

(අ) තොරතුරු නිලධාරියා වෙත මුදලින් ගෙවීමෙන්

(ආ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ගණකාධිකාරී වෙත බැංකු අණකරයකින්

(ඇ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ගණකාධිකාරී වෙත ගෙවිය හැකි වන පරිදි තැපැල් ගෙවුම් පතකින් හෝ තැපැල් ඇණවුමකින්

ගෙවීම් කළ ආකාරය කුමක් වුවද තොරතුරු නිලධාරියා ඒ වෙනුවෙන් ලදු පතක් නිකුත් කරනු ඇත.

## තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ (RTI) සාමාජිකයින්

1 මහින්ද ගම්මන්පිල මහතා

2 කිෂාලි පින්ටෝ - ජයවර්ධන මහත්මිය

3 එස්. ජී. පුංචිහේවා මහතා

4 විනිසුරු ඒ. ඩබ්. ඒ. සලාම්

5 ආචාර්ය සෙල්වි තිරුචෙල්වම්

## RTI කොමිසම සම්බන්ධ කර ගැනීමේ විස්තර


ලිපිනය : අංක 203 - 204 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා
ගොඩනැගිල්ල, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.

දුරකථන : +94 112691625

වෙබ් : www.rticommission.lk

විද්‍යුත් තැපැල : rticommission16@gmail.com